**මාතලේ දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 23 – 2023**

-----------------------------------------------------------------------

## 1. විගණන මතය

**1.1** මාතලේ දිස්ත්‍රික්කයේගොවිජන සේවා කාරක සභා 23 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 23 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 අනුව උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුව ද, ගොවිජන සේවා කාරක සභා 08 ක එකතුව රු.2,250,518 ක අක්කර බදු ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි ගිණුම් වාර්තා සකස් කිරීමේදී අක්කර බදු ආදායම් උපචිත පදනම මත ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 9 හි 38 ඡේදය අනුව හානි වූ හෝ යල්පැනගිය තොගවලට අදාළව ශුද්ධ උපලබ්ධිත අගය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභාවේ 2023 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත්වූ රු.529,942 ක කෘෂි රසායන තොගයක් අවසන් තොග ශේෂය තුළ ගත්මිල පදනම් කරගනිමින් දක්වා තිබුණි. | ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරන බව. | විනාශ වූ හා යල්පැනගිය තොගවල ශුද්ධ උපලබ්ධිත අගය ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 4 ක් විසින් ප්‍රතිපූරණය කළ යුතු රු.662,454 ක ලැබීම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සහ ප්‍රතිපූරණය කරගත හැකි රු.125,050 ක ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂය තුළ දරන ලද වියදම් බැවින් ගිණුම්ගත කළ බව හා ඉදිරියේදී නිවැරදිව ගැලපුම් කරන බව. | කාරක සභාවේ ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සහනාධාර පොහොර අලෙවිය තුළින් කාරක සභාවට ලාභයක් හෝ පාඩුවක් සිදු නොවන නමුත් ගලේවෙල ගොවිජන සේවා කාරක සභාව සහනාධාර පොහොර වෙළඳ ගිණුමක් පිළියෙල කර එහි ගැණුම් වටිනාකම දෝෂ සහගතව සටහන් කිරීම හේතුවෙන් වෙළඳ ගිණුමේ රු.229,329 ක දළ අලාභයක් හඳුනා ගැනීම නිසා කාරක සභාවේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි. | නිවැරදි කිරීමට උපදෙස් දුන් බව. | ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාව මගින් සමාලෝචිත වර්ෂයේ පොහොර වෙළඳ ගිණුම පිළියෙල කිරීමේදී එම්.ඕ.පී හා යූරියා පොහොර වර්ගවල රු.6,000,000 ක ගැණුම් වටිනාකම හා රු.709,200 ක ආරම්භක තොග වටිනාකම විකුණුම් පිරිවැය තුළ ඇතුළත් නොකිරීමෙන් දළ ලාභය හා අතිරික්තය රු.6,709,200 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම්.ඕ.පී හා යූරියා පොහොරවල ගැණුම් වටිනාකම වෙළඳ ගිණුමට අතපසුවීමකින් ගෙන නොමැති බව හා 2024 ගිණුම් වාර්තාව සැකසීමේදී සිදු වී ඇති වැරදි නිවැරදි කිරීමට කටයුතුකරන බව. | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 03 ක විගණන ගාස්තු රු.62,300 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් බැරකම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව දැක්වීමට හා ගෙවීම් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2018, 2019 හා 2020 වර්ෂවලට අදාළව හුණුකැටඇල ගොවිජන බැංකුව විසින් ගෙවන ලද රු.263,440 ක ලාභාංශ ආදායම ලැබිය යුතු ලාභාංශ ගිණුමට ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සමුච්චිත අරමුදලට ගලපා ගිණුම් නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව. | නිසි පරිදි ගැලපීම් සිදු කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ලග්ගල පල්ලේගම ගොවිජන සේවා කාරක සභාවට ලැබී තිබුණු ස්ථාවර වත්කම් 13 කට අදාළ සමාලෝචිත වර්ෂයේ ක්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ එකතුව රු.176,515 ක් ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී එය නිවැරදි කරන බව. | වත්කම්වලට අදාළ නිවැරදි ක්ෂය වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් මගින්ඉකුත් වර්ෂවලට අදාළ රු.320,451 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා 06 ක ඉකුත් වර්ෂයේ සිදු කර තිබුණු රු.1,507,633 ක ගිණුම්කරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂය තුළදී ද නිවැරදි කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (එ) | ගොවිජන සේවා කාරක සභා 06 ක් මගින්, GEO GOVIYA වැඩසටහන යටතේ කුඹුරු ඉඩම් කැබලි 18859 ක් මැනීමට අදාළ කාරක සභා ආදායම වූ රු.92,015 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | ගොවිජන සේවා කාරක සභා 12 ක් මගින් ගොවිජන බැංකු මෘදුකාංගයක් හා මෘදුකාංගයට අදාළ උපාංගය මිලදී ගැනීම වෙනුවෙන් රු.1,491,211 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වී මාස 03 සිට 05 දක්වා කාලයක් ගතවන තුරුත් එම වත්කම් කාරක සභා වෙතලැබී නොතිබියදී ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් අනුව ගෙවීම් කළ බව හා අදාළ උපාංග ලැබෙමින් පවතින බව. | වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඔ) | 2023 නොවැම්බර් 13 දිනැති අංක 5/3/5/1/23 දරන ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ ලිපියට අනුව කාරක සභා ගොඩනැගිලිවල තක්සේරුගත වටිනාකම දක්වා තිබුණද ගොවිජන සේවා කාරක සභා 05 ක් මගින් ගොඩනැගිලි තක්සේරු වටිනාකම වූ රු.3,565,000 ක් හා ඊට අදාළ වර්ෂයේ ක්ෂය රු.1,651,643 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර ලග්ගල පල්ලේගම හා තැන්න ගොවිජන සේවා කාරක සභා මගින් තක්සේරුගත වටිනාකමට ගිණුම්ගත කර තිබුණද ඊට අදාළ වර්ෂයේ ක්ෂය රු.515,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුය. |
| (ඕ) | ගොවිජන සේවා කාරක සභා 04 ක් මගින් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් රු.44,831 ක්, ජංගම වත්කම් රු.82,670 ක් හා ජංගම වගකීම් රු.19,273 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ක) | ගොවිජන සේවා කාරක සභා 04 ක් මගින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාළ රු.1,693,430 ක ලාභංශ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ග) | ගොවිජන සේවා කාරක සභා 13 ක සමාලෝචිත වර්ෂයට අදාළ රු.299,427 ක ආදායම්, රු.697,515 ක ජංගම වගකීම් හා රු.440,699 ක ජංගම වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 10 ක ආදායම් විෂයයන් 4 ක, වත්කම් විෂයයන් 7 ක, වගකීම් විෂයයක හා වියදම් විෂයයකට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන්, අනුරූපී වාර්තා සමඟ සැසඳීමේදී එකතුව රු.1,206,348 ක නොසැසඳීම් පැවතුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 09 ක මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ගොවිජන බැංකුවෙන් වාර්ෂිකව ලැබිය යුතු ලාභාංශ වටිනාකම, ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී එකතුවරු.10,924,004 ක නොසැසඳීම් පැවතුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාවේ පොහොර ප්‍රමාණාත්මක තොග ගිණුම අනුව වූ සමාලෝචිත වර්ෂයේ විකුණුම් ප්‍රමාණ හා ඒකක ගැණුම් මිල සහ විකුණුම් මිල අතර ලාභාන්තිකය සැලකීමේදී පොහොර විකුණුම් තුළින් රු.1,384,661 ක දළ ලාභයක් ලැබිය යුතු වුවද පොහොර වෙළඳ ගිණුමේ රු.6,727,946 ක දළ ලාභයක් දක්වා තිබුණු බැවින් රු.5,343,285 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී පිළිතුරු සැපයීමට කටයුතු කරන බව. | නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

**1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාලවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් වසර ගණනාවක සිට ඉදිරියට ගෙන ආ එකතුව රු.76,235 ක් වූ බැර ශේෂයක් හා රු.33,760 ක හර ශේෂයක් ඉකුත් වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගැලපීම් කර කපා හැර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඒ සඳහා ලිඛිත අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | නැවතත් එම ශේෂ සඳහා අනුමැතිය ලබා ගැනීමට ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් හට ඉදිරිපත් කර අවසර ලබා ගැනීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියක් සහිතව ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දේවහුව ගොවිජන බැංකුවේ පාලන ගිණුම් 05 කට අදාළව වර්ෂවලදී බැර කිරීමට නොහැකි වූ රු.64,581 ක ශේෂයක් නිසි අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට හර කර ගලපා තිබුණි. | ඉදිරි වර්ෂ සඳහා සමුච්චිත අරමුදලට සිදු කරනු ලබන හර කිරීම් සඳහා නියෝජ්‍ය කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියක් මත පමණක් ගිණුම් ශේෂ කපාහැරිය යුතුය. |

**1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 12 ක මූලා‍ ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.1,750,297 ක වත්කම් විෂයයන් 08 ක, එකතුව රු.1,339,456 ක වගකීම් විෂයයන් 05 ක හා රු.1,819,801 ක් වූ හිමිකම් විෂයයකට අදාළ උපලේඛන, ශේෂ සනාථ කිරීමේ ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | පෙර සිට ගිණුම් වාර්තාවල එන ශේෂ වන බැවින් විස්තර සොයා ගැනීමට නොහැකි වී ඇති බව, ඉතිරි කිරීමේ ගිණුම්, සඳහා පාස් පොත් ලබා ගැනීමට කටයුතු කරන බව හා ඉදිරියේදී නිරාකරණය කර ගැනීමට සටහන් කර ගත් බව. | ගිණුම් ශේෂ තහවුරු කර ගැනීම සඳහා සියලුම සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| **i.** | 53 (4) (අ) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 14 ක වසම් 217 ක කුඹුරු ඉඩම් නාම ලේඛන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් පරීක්ෂා කර සහතික කර නොතිබුණි. | ලේඛන වල අඩුපාඩු නිවැරදි කරගෙන යන අතර එම අඩුපාඩු නිවැරදි කර අත්සන් ලබා ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| **ii.** | 51(3) (i) | ලග්ගල ගොවිජන සේවා කාරක සභාව ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයේ සියලුම ගොවි සංවිධානවල එක් නියෝජිතයෙකු හෝ සමන්විත වන ලෙස සැකසී නොතිබුණු අතර කාරක සභාවේ ලියාපදිංචි ගොවි සංවිධාන 18 ක් අතරින් ගොවි සංවිධාන 05 ක නිලධාරීන් 05 දෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. | ගොවි සංවිධාන 18 න් 12 ක්ම අක්‍රිය වී ඇති බැවින් සක්‍රිය ගොවි සංවිධාන 6 න් 05 දෙනෙකු සහභාගි කර ගත් බව. | සියලුම ගොවි සංවිධාන සක්‍රිය මට්ටමින් පවත්වා ගනිමින් සහභාගි කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| i. | මු.රෙ. 315 | ගොවිජන සේවා කාරක සභා 07 ක් මඟින් මාර්ගස්ථ මුදල් පිළිබඳව රක්ෂණාවරණයක් ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 396 (ඇ) | දඹුල්ල හා හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභා විසින් නිකුත් කළ නමුත් මුදල් ලබා ගැනීමට ඉදිරිපත් නොවූ කාලය ඉකුත් වූ රු.226,248 ක් වටිනා චෙක්පත් 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | - එම - |
| (ඇ) | **2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | ගොවිජන සේවා කාරක සභා 10 ක මාස 08 සිට 12 දක්වා කාලයක් නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීමට සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 11ක ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළද මුද්‍රිත පිටපත් ලබා ගෙන පැමිණීම, පිටවීම අධීක්ෂණය කර නොතිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය නිසි ක්‍රියාකාරිත්වයේ නොමැති බැවින් අලුත්වැඩියාවට යොමු කර ඇති බව හාමේ පිළිබඳව අවධානය යොමු කර කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ගොවිජන සේවා කොමසාරිස් චක්‍රලේඛ** | | | |
| i. | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30(4) ඡේදය | යන්ත්‍රෝපකරණ පිරිවැය මත ක්ෂය කළ යුතු වුවද පලාපත්වල හා බණ්ඩරපොල යනගොවිජන සේවා කාරක සභාවල යන්ත්‍රෝපකරණ හා දඹුල්ල ගොවිජන සේවා කාරක සභාවේ ගොඩනැගිලි හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය කර තිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පුහුණු කරන ලද ගිණුම් ප්‍රතිපත්ති අනුව සියලු වත්කම් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| ii. | 1984 අගෝස්තු 27 දිනැති අංක 268 | හඳුන්ගමුව ගොවිජන සේවා කාරක සභාව මඟින් 2020 | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | දරන චක්‍රලේඛය | වර්ෂයේ සිට පැවත එන රු.44,887 ක හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | කළ යුතුය. |
| **iii.** | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 04 ක් මඟින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.414,000 ක කාමර කුලී අයකර නොතිබුණි. | කුලී අයකර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | - එම - |
| **iv.** | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 15 (3) වගන්තිය හා 1988 මැයි 27 දිනැති අංක 322 දරන චක්‍රලේඛයේ 12 (1) ඡේදය | ගොවිජන සේවා කාරක සභා 03 කට අදාළව වසර 02 සිට වසර 25 දක්වා කාලයක සිට පැවත එන රු.243,963 ක ඉඩම් හිමි ප්‍රවේණි මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලිපිවලින් දැනුම් දී ඇති බව, ගොවිජන සංවර්ධන අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව හා අඳ ගොවීන් හා ඉඩම් හිමියන් අතර ගැටළු මත අධිකරණයේ නඩු තීරණ මත අවශ්‍ය කටයුතු කරන බව. | - එම - |
| **v.** | 2000 ජුනි 06 දිනැති අංක 518/2000 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 03 ඡේදය හා 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘති චක්‍රලේඛයේ 5.6 (i) ඡේදය | 2023වර්ෂයේ ගොවිජන බැංකු 23 හි මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා කාරක සභාවල මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව ගිණුම් වාර්තාව සකස් කර ඇති බව. | - එම - |
| **vi.** | 2012 පෙබරවාරි 29 දිනැති ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 04/2012 ගොවි බැංකු (නියමු) චක්‍රලේඛයේ 3.4.2 (ii)ඡේදය | වගා ණය ලබාදුන් දින සිට මාස 06 ක් ඇතුළත සියලුම ණය මුදල් හා පොලිය නැවත අයකරගත යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 16 ක් මඟින් ගොවීන් 548දෙනෙකුට ලබාදුන් එකතු වටිනාකම රු.22,060,067 ක් වූ වගා ණයනියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට විනිශ්චය සභා වෙත යොමු කර ඇති බව හා ඉදිරියේදී නීතිමය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | ණය කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **vii.** | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 3.8 ඡේදය | කෙටි කාලීන නොවන වෙනත් වගා ව්‍යාපෘති හා ඒ ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීමට හා පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීමට නිකුත් කරනු ලබන ණය, ව්‍යාපෘති ණය යටතට ගත යුතු බව සඳහන් කර තිබුණද යටවත්ත හා වේරගම ගොවිජන සේවා කාරක සභා විසින් ඊට අනුකූල නොවන ලෙස සිල්ලර වෙළදාම, වඩු වැඩ හා රසකැවිලි නිෂ්පාදනය වැනි වෙනත් කාර්යයන් සඳහා ගොවීන් 34 දෙනෙකු වෙත රු.759,194 ක් වූ ණය ලබාදී තිබුණි. | 2012/4 චක්‍රලේඛයට අනුව ඉදිරියේදී ණය නිකුත් කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගත් බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| **viii.** | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 4.23.1 හා 4.23.2 ඡේද | හඳුන්වා දී ඇති ආකෘති පත්‍ර අනුව කොටස්කරුවන් 1390 කගේ හා තැපන්පත්කරුවන් 1336 කගේ තොරතුරු කොටස් හා තැන්පත් ලෙජර පල්ලෙපොල ගොවිජන බැංකුව විසින් යාවත්කාලීන කර නොතිබුණි. එමෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය තැන්පත්කරුවන් 93 දෙනෙකු එකතුව රු.1,025,207 ක තැන්පත් පවත්වාගෙන ගොස් තිබුණද එම ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය තැන්පත්කරුවන්ගේ ලෙජරයක්ද නොතිබුණි. | ගොවිජන බැංකුවේ ගිණුම් සඳහා ලෙජරගත කිරීම විධිමත්ව මුල සිට සිදු වී නොතිබූ අතර මේවන විට ඉහත පරිදි මෙම ගිණුම් සඳහා උප ලෙජර යෙදීම ආරම්භ කර ඇති බව හා මේ වන විට ලෙජර යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | ලේඛන විධිමත්ව යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |
| **xi.** | 2013 මාර්තු 08 දිනැති අංක 04/2013 දරන චක්‍රලේඛය | හඳුන්ගමුව, බණ්ඩරපොල හා අළුගොල්ල ගොවිජන සේවා කාරක සභාවල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින්2023 වර්ෂයේ විකුණා මුදල් ගෙවීමේ පදනම මත ගනුදෙනුවලට සහභාගි වී අලෙවි කටයුතු මගින් ගොවිජන සේවා කාරක සභාවේ ආදායම් තත්ත්වය වර්ධනය කර ගැනීමට දායක වී නොතිබුණු අතර,වාසලකෝට්ටේ,අළුගොල් ල, කිඹිස්ස, දේවහුව, හත්තොටඅමුණ ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය උපයෝගි කර ගනිමින් ගොවි නිෂ්පාදන අලෙවිය, තාවකාලික ආපනශාලා | පෙර වර්ෂවල හිඟ ශේෂ පැවතීම හේතුවෙන් විකුණා මුදල් ගෙවීමේ පදනම මත ද්‍රව්‍ය නිකුත් නොකළ බව හා ඉදිරියේදී අලෙවිය ප්‍රවර්ධනයට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | පැවැත්වීම හා ගොවි සංවිධානවල කෘෂි නිෂ්පාදන ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අලෙවි කිරීම වැනි කටයුතු සිදු කර නොතිබුණි. | | |
| **x.** | 2016 පෙබරවාරි 09 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකු විසින් අවම වශයෙන් මාස 04 කට වරක්වත් ගොවි සංවිධාන පරීක්ෂා කර ගොවි සංවිධාන පරීක්ෂණ වාර්තාවක් ගොවිජන සංවර්ධන නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 16 ක වසම් 292 කට අයත් ගොවි සංවිධාන 414 ක් සම්බන්ධයෙන් එවැනි වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන බව. | - එම - |
| **xi.** | 2018 මැයි 17 දිනැති අංක 7/5/2/1–2(1) දරන ලිපිය | කිඹිස්ස ගොවිජන සේවා කාරක සභාව මගින් අවස්ථා 03 කදී රු.50,000 ක සීමාව ඉක්මවා තිබුණු එකතුව රු.2,310,250 ක ගෙවීම් සඳහා ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ අනු අත්සන් ලබා ගෙන නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර එවැනි අඩුපාඩු නොවීමට කටයුතු කරන බව. | - එම - |
| **xii.** | 2021 ඔක්තෝබර් 27 දිනැති අංක 16/2021 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | දඹුල්ල ගොවිජන බැංකුව මගින් කල්පසු වූ ණය සඳහා ගොවීන් වෙත පොලී සහන සලසා තිබුණි. එම චක්‍රලේඛයේ පියවර 05 අනුව පොලී කපා හැරීමෙන් පසුවද ණය මුදල් ගෙවා නොමැති ණයකරුවන්ට වහාම නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පොලී සහන ලබා දෙන අවස්ථාවේදී විනිශ්චය සභා වෙත යොමු කරන ලද ගොවීන් 38 දෙනෙකු කිසිදු වාරික මුදලක් ගෙවා නොතිබුණු අතර එම ගොවීන්ගෙන් රු.1,189,888 ක් අයකර ගැනීමට පැවතියද නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට විනිශ්චය සභා වෙත යොමු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **xiii.** | 2023 අප්‍රේල් 24 දිනැති අංක | සෑම කාර්තුවක් අවසානයේදීම ආපදා ණය ආවරණ ගිණුමේ | 2023 වසරේ රැස් වූ මුදල් ආපදා අරමුදල් ස්ථාවර | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු |

| | | |
|---|---|---|
| 01/2023 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 07 ඡේදය | රුස්වූ මුදල් ආපදා අරමුදල් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 10 ක ගොවිජන බැංකු මඟින්එලෙස ස්ථාවර තැන්පතු ගිණුමක මුදල් තැන්පත් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආපදා අරමුදල් ඉතුරුම් ගිණුම්වල ශේෂය ලෙස එකතුව රු.1,161,846 ක් පැවතුණි. | තැන්පත් ගිණුමක තැන්පත් කළ යුතුය. කරන ලෙස උපදෙස් දුන් බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 19 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුවරු.23,298,179 ක අතිරික්තයක් හා කාරක සභා 04 ක මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.725,470 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව කාරක සභා 21 ක ඉකුත් වර්ෂයේ රු.15,210,735 ක අතිරික්තයක්ද කාරක සභා 02 ක රු.215,178 ක ඌණතාවයක්ද විය. සමාලෝචිත වර්ෂයේ ගොවි බැංකු 23 හි මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,039,352 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයද රු.5,300,046 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම් විසින් දෛනික ලැබීම් ලේඛනය පරීක්ෂා කර අධීක්ෂණය කළ බවටද අත්සන් තබා නොතිබීමෙන් අවිධිමත් තත්ත්වයක් පැවති අතර ලේඛනගත කර තිබුණු ලැබීම් ගෙවීම් අනුව දින 08 ක මුදල් ශේෂය ඍණ වූ අවස්ථා පැවතුණු අතර දෛනික ලේඛනයේ ඇතුළත් නොවූ ආදායම් බැංකුගත වී තිබුණි. 2014 අගෝස්තු 22 දිනැති ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 07/2014 (107 සංශෝධනය iii) චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ දින 8 කදී රු.138,768 සිට රු.1,676,275 ක් දක්වා මුදල් ශේෂයන් අත රඳවාගෙන ද තිබුණි.<br>මෙම තත්ත්වය මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.259,616 ක අතැති මුදල් ශේෂයේ නිවැරදිතාවය ලේඛනය අනුව තහවුරු නොවුණි. | මේ වන විට අදාළ ලේඛන නිවැරදිව සකස් කර සහතික කර ඇති බව හා ලේඛන සැසඳීමේදී සටහන් දෙකක් ඇති බව. මේ වන විට නිවැරදි ශේෂය ගණනය කර ඇති බව. | මුදල් පාලනයට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු බව හා අතඉතිරි ශේෂයේ නිවැරදිතාවය අධීක්ෂණය කිරීම කළ යුතුය. |

## 3.2 අනාර්ථික ගණුදෙනු / හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාව මගින් ගොවීන්ගේ අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව වටිනාකම රු.600,000 ක් වූ බඩ ඉරිඟු යූරියා පොහොර කිලෝග්‍රෑම් 2000 ක තොගයක් අළුගොල්ල ගොවිජන සේවා කාරක සභාවෙන් අත්පිට මුදලට සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබුණද, ඉන් කිලෝග්‍රෑම් 210 ක් පමණක් අලෙවිකර සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කිලෝග්‍රෑම් 1790 ක තොගයක් ඉතිරි වී තිබුණි. | බඩ ඉරිඟු වගා කළ ගොවීන් වෙත මිලදී ගත්තද පසුව ගොවීන් එම පොහොර ප්‍රතික්ෂේප කිරීම නිසා කිලෝග්‍රෑම් 1790 ක් ඉතිරි වූ බව. | ගොවීන්ගේ අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන සැලසුම් සහගතව මිලදී ගත යුතුය. |
| (ආ) | ගලේවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් 2023 පෙරවාරි 28 දින රු.1,275,000 ක් වටිනා මිරිස් පොහොර හා එළවළු පොහොර, පෞද්ගලික පොහොර සමාගමකින් ලබාගෙන ඒවායේ වෙළඳපල මිල අඩුවීම මත වන පාඩුව පියවා ගැනීමක් ලෙස රු.172,200 ක් වූ ගෙවතු පොහොර 2023 ජූලි 06 දින ලබාගෙන තිබුණි. නමුත් අවශ්‍යතාවය හඳුනා නොගෙන මිලදී ගැනීම හේතුවෙන් එම ගෙවතු පොහොර තොගයෙන් කිසිවක් අලෙවි වී නොතිබුණි. | මින් ඉදිරියට එවැනි තත්ත්වයන් ඇති නොවන ලෙස කටයුතු කරන අතර එම පොහොර තොගය නැවත හරවා යැවීමට හෝ මිලගණන් පහළ දමා ගැනීමට අදාළ අයතනය සමඟ සාකච්ඡා කරමින් සිටින බව. | කාරක සභාවට සිදු වන අලාභය හැකිතාක් අවම කරගත හැකි ලෙස තොග මිලදී ගැනීම හා අලෙවි කටයුතු ප්‍රවර්ධනය කර ගැනීම කළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07 කට අයත් ඉඩම් පවරා ගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභාවට අයත් ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කිඹිස්ස ගොවිජන සේවා කාරක සභාවේ අක්කර 02 කට ආසන්න වපසරියකින් යුත් ඉඩම වටා රු.500,000 ක් වැයකර ඉදිකර තිබුණු ඉදිරිපස දැල් ආවරණය සහිත හා කොන්ක්‍රීට් කණු සහිත කටුකම්බි වැටේ ස්ථාන 04 කට හා මධ්‍යස්ථානයේ ගොඩනැගිලි වලට වන අලින් විසින් සමාලෝචිත වර්ෂයේ හානිකර තිබුණද වන අලි තර්ජන වලින් මධ්‍යස්ථාන භූමිය හා ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීම සඳහා නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අලිවැටක් ඉදිකර වනසතුන්ගෙන් භූමිය ආරක්ෂා කර ගැනීම සඳහා 2024 ජූනි මස කාරක සභාවෙ සාකච්ඡා කර යෝජනාවලියක් නියෝජ්‍ය කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | වන අලි තර්ජන අවම කර ගැනීමට විධිමත් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/5/2/ගි.වා./කා.ගො. දරන ලිපිය අනුව දිගු කලක සිට පැවත එන නිරවුල් නොවූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු බව සඳහන් වුවද ,ගොවිජන සේවා කාරක සභා 19 ක මූල්‍ය ප්‍රකාශනවල වසර 02 සිට වසර 30දක්වා කාලයක සිට පැවත එන රු.7,349,177 ක ලැබිය යුතු ගිණුම් ශේෂ 56 ක් හා රු.15,109,700 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 51 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතුය. |
| (ඈ) | වාසල කෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවට අදාළව 1994 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළ රු.67,100 ක හිඟ විගණන ගාස්තු ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හිඟ විගණන ගාස්තු ශේෂය නිරවුල් කළ යුතුය. |
| (ඉ) | 2023 මැයි 16 දිනැති ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 77/කෘ.ඉ.ලේ.ප්‍රති/2023 දරන ලිපිය අනුව කුඹුරු ඉඩම් මැනීමේ කටයුතු 2023 මැයි 31 දින වන විට අවසන් කළ යුතු වුවද 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගොවිජන සේවා කාරක සභා 08 ක කුඹුරු ඉඩම් 1438ක් මැනීම් කර නොතිබුණි. | මේ වන විට මැනුම් කටයුතු කඩිනමින් සිදු කර හැකි ඉක්මනින් අවසන් කිරීමට නියමිත බව. | මැනුම් කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |
| (ඊ) | වාරිමාර්ග ලේඛනයක් නඩත්තු කර එහි සඳහන් තොරතුරු යාවත්කාලීන බවට පරීක්ෂා කර වාර්ෂිකව සහතික කළ යුතු බව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් 2008 ජනවාරි 01 දිනැතිව උපදෙස් ලබාදී ඇතත් ගොවිජන සේවා කාරක සභා 09 ක වැව් හා අමුණු 307 ක් සම්බන්ධ තොරතුරු වර්ෂ 01 සිට වර්ෂ 16 දක්වා කාලයක සිට වාරිමාර්ග ලේඛනයේ යාවත්කාලීන කර නොතිබුණු අතර වැව් හා අමුණු 39 ක් පිළිබඳ කිසිදු තොරතුරක් වාර්තා කර නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ලේඛන යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (උ) | වාසලකෝට්ටේ ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශය තුළ ඇති අමුණු 05 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණු අතර,මාඋස්සන ඔය අමුණ වතුර නොමැති වීම නිසා වසර 10 ක පමණ | මුදල් ප්‍රතිපාදන ලැබුණු පසු අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව හා කැඩී ඇති අමුණු හා ජලය නොමැති වීම නිසා අක්‍රියව පවතින අමුණු අලුත්වැඩියාකොට | වාරිමාර්ග නිසි පරිදි නඩත්තුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලයක සිට අක්‍රියව පැවතුණි.තවද රත්තොට ගොවිජන සේවා කාරකසභා බලප්‍රදේශයේ වසම් 4 ක වී වගාව සඳහා සුදුසු තත්ත්වයේ පවතින කුඹුරු ඉඩම් අක්කර 28 ක් අමුණු ප්‍රතිසංස්කරණය නොකිරීම, ඇල මාර්ගයේ ජලය ගලා ඒම අවහිර වී තිබීම හා පෞද්ගලික පාර්ශවයන් විසින් කුඹුරුයායට පිවිසෙන මාර්ගය අවහිර කිරීම මත වසර 1 සිට 25 දක්වා කාලසීමාවක් වී වගා නොකර වෙනත් බෝග වගා කරමින් හා කිසිදු වගාවක් නොකර නිෂ්කාර්යව පැවතුණි. | එමගින් වගාකළ හැකි ඉඩම් ප්‍රමාණය වගා කිරිමට කටයුතු කිරිමට සිදුකරමින් පවතින බව. | |
| (ඌ) | ගොවිජන සේවා කාරක සභා05 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 11 දෙනෙකුගෙන් විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් අයවිය යුතු රු.1,271,877 ක මුදලක් වර්ෂ 2 සිට 10 දක්වා කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් පියවන ලෙස එම නිලධාරින්ට දැනුම් දී ඇති බව. | හිඟ මුදල් කඩිනමින් අයකර ගත යුතුය |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 හි විධිවිධාන අනුගමනය නොකර 2022 ජූලි සිට 2023 මාර්තු දක්වා කාලය තුළ පෞද්ගලික ආයතනයනයකින් එකතුව රු.9,085,000 ක පොහොර අත්පිට මුදලට මිලට ගෙන තිබුණු අතර පසුව මිල විචලනයන් සිදුවීම හා විකිණීමට නොහැකි වීම යන පදනම් යටතේ ගැණුම් පිරිවැය රු.1,286,250 ක තොග ආපසු හරවා යවා තිබුණද, වෙනත් ද්‍රව්‍ය හෝ මුදල් ආපසු ලබාගෙන නොතිබුණි. | නියෝජිත ධුර ලබාගෙන ඇති බව හා පොදුවේ මිල ගණන් ලේඛන ඉදිරිපත් කරන නිසා එකිනෙකට අමුණා නොමැති බව හා මෙසේ මිල අඩුවීම අසාමාන්‍ය ලෙස මුහුණ දුන් තත්ත්වයක් බව.<br>තවද ගොවිජන සේවා මධ්‍යස්ථානයේ වැඩ ප්‍රමාණය අධික වීම, වෙළඳපල තරඟකාරිත්වය මත කටයුතු කිරීමට සිදු වීම වැනි කාරණා මත තොරතුරු ගොනු කිරීම හා ලේඛන සකස් කිරීමේ අඩුපාඩු සිදු වී ඇති බව හා ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව. | විනිවිධභාවයකින් යුතුව ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව හා ආපසු භාර දීමේ ලිඛිත එකඟතා ඇති කර ගනිමින් සැපයුම්කරුවන් සමඟ ගනුදෙනු කළ යුතුය. |
| (ආ) | ගලේවෙල ගොවිජන සේවා කාරක සභාව මඟින් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය නොකර පෞද්ගලික ආයතනයක් වෙතින් ඉකුත් වර්ෂයේදී අත්පිට මුදලට එළවළු පොහොර කිලෝ ග්‍රෑම් 6378 ක් | ගොවීන්ගේ අවශ්‍යතාව මත දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු දැනුවත් කිරීම මත ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව | කාරක සභාවට සිදු වන අලාභය හැකිතාක් අවම කරගත හැකි |

| | | | |
|---|---|---|---|
| | මිලදීගෙන සමාලෝචිත වර්ෂය වන විටත් අලෙවි කරගත නොහැකිව ඉන් කිලෝග්‍රෑම් 6377 ක තොගයක් ගත් මිල වූ රු.436 ට වඩා අඩු රු.165 ක මිලකට එනම්, රු.1,728,167 ක අලාභයක් සහිතව විකුණා තිබුණි. තොග අලෙවි නොවීම මත වෙනත් පොහොර ලබාදීමට එකඟ නොවූ එම සමාගමෙන්ම ප්‍රසම්පාදන නියමයන්ගෙන් බැහැරව සමාලෝචිත වර්ෂය තුළ නැවතත් රු.2,400,000 ක් යූරියා පොහොර කිලෝග්‍රෑම් 50 මිටි 300 ක් මිලදී ගෙන තිබුණි. | පොහොර ලබා ගැනීමට සිදු වූ බව. තවද අවස්ථා 04 කදී නියෝජ්‍ය කොමසාරිස් දැනුවත් කරමින් පොහොර තොගය මිලදී ගත්තද සුළු කාලයක් ඉක්මයත්ම රජයේ ප්‍රතිපත්ති හා තීන්දු තීරණ මත පොහොර මිල සීග්‍රයෙන් පහළ ගිය බව. | ලෙස කටයුතු කළ යුතු බව හා ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) | 2019 මාර්තු 15 දින හෙට්ටිපොල කාරක සභාවේ ඉල්ලීමකින් තොරව රු.4,487,532 ක දියර පොහොර ලීටර් 5212 ක් සී/ස ලංකා පොහොර සමාගම විසින් කාරක සභාවට භාරදී භාවිතා නොකිරීම හේතුවෙන් 2020 වර්ෂයේ කල් ඉකුත්ව තිබුණි. එම තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අවසන් තොග යටතේ හා ගෙවිය යුතු ශේෂ යටතේ ද දක්වා තිබුණි. | මෙම පොහොර තොගය සම්බන්ධයෙන් දැනට නීතිමය කාර්යයන් සිදුවෙමින් පවතින බව හා සීමාසහිත ලංකා පොහොර සමාගම විසින් දැනුවත් කර ඇති බැවින් එම කටයුතු අනුව ඉදිරියේදී තොගය භාරදීමට හෝ ඉවත් කිරීමට පියවර ගන්නා බව. | අදාළ සමාගම දැනුවත් කර පොහොර තොගය ආපසු භාරදීමට හෝ වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කළ යුතුය. |

### 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිඹිස්ස ගොවිජන සේවා කාරක සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට රු.1,396,448 ක් ලෙස හා සමාලෝචිත වර්ෂය අවසාන වී මාස 4 ක් ගත වන විට රු.2,566,386 ක් ලෙස ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය වර්ධනය වී පැවතියද එම මුදල් වැඩි පොලියක් සහිත ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුමේ මුදල් සහනාධාර පොහොර ණය මුදල් පියවීමට ගෙවිය යුතු බැවින් නැවත ආදායම් උපදවන මාර්ගයක ආයෝජනය කිරිමට නොහැකි වී ඇති බව. | කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගැනීමට යටත්ව කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිඹිස්ස ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ 2012 වර්ෂයේදී ඉදිකළ ගබඩා ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය අවසානවී මාස 05 ක් ගතවන විටත් ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් වසර 10 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. එම ගොඩනැගිල්ල ඉදිරිපස ඇලුමිනියම් හා | මේ වන විට කාරක සභාවේ තීරණයකට අනුව කාරක සභා අරමුදලින් ප්‍රත්සංස්කරණය කර මහවැලි ව්‍යාපෘත කාර්යාලය එහි ස්ථාපිත කිරීමට නියෝජ්‍ය කොමසාරිස්ගෙ අනුමැතිය ලැබී ඇති බව. | නිෂ්කාර්ය වත්කම් උපයෝජනය කළ යුතුය. |

වීදුරුවලින් නිම වූ දොරක්, ජනේලයක් හා වහලයේ ඇස්බැස්ටෝස් තහඩු දෙකක්ද හානියට ලක්වී පැවතුණි.

### 3.7 මූල්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හඳුන්ගමුව ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඇතුළත් රු.171,796 ක මුදල් ඌනය සනාථ කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වී මාස 05 ක් ගතවන විටත් කිසිදු විධිමත් පරීක්ෂණයක්සිදු කොට අදාළ මුදල වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ 2023 මාර්තු 07 දිනැති අංක 5/3/5/6 දරන " අත ඉතිරි මුදල් සීමාව ඉක්මවා මුදල් රඳවා ගැනීම " යන ලිපියෙන් දැනුවත් කර තිබුණු රු.186,916 ක මුදල් ඌනතාවය සම්බන්ධයෙන් ද මේ වන තෙක් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම කරුණු සම්බන්ධයෙන් විනය පියවර ගැනිම සඳහා විනය බලධාරියාවන කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කර ඇති අතර කටයුතු කඩිනම් කිරීම සඳහා පියවර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේ සිට ඇල්කඩුව ගොවිජන බැංකුවේ රාජකාරි ඉටුකළ සංවර්ධන නිලධාරිනියක විසින් රු.743,248 ක අක්‍රමිකතාවයක් සිදු කර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය යටතේ වරදක් සිදු කර තිබියදී ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31 වැනි වගන්තිය ප්‍රකාරව සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව වෙනත් ගොවිජන සේවා කාරක සභාවකට ස්ථාන මාරු කිරීම පමණක් සිදු කර තිබුණි. | මෙම කරුණට අදාල සංවර්ධන නිලධාරිගේ කටයුතු සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් කර දැනට වැඩ තහනම්කර ඇති අතර ඉදිරි විනය ක්‍රියාමාර්ග කොමසාරිස් ජනරාල් විසින් ගනිමින් පවතින බව. | මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධ කඩිනම් විනය ක්‍රියාමාර්ග ගැනීමට හා අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාවේ හිටපු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියකු සිදු කළ මූල්‍ය අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණයකින් පසුව 2019 වර්ෂයේ සිට රු.778,310 ක් අයකිරීමට තීරණය කර තිබුණි. එම වර්ෂයේ සිට 2022 දක්වා කාලය තුළ රු.345,000 ක මුදලක් අයකර තිබුණද, කිසිදු හේතු දැක්වීමකින් තොරව | මේ සම්බන්ධව විනය කටයුතු කොමසාරිස් ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරමින් පවතින බව. | - එම - |

රු.433,310 ක මුදල අයකිරීම අත්හිටුවා තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 18 කට අයත් වසම් 117ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 117දෙනෙකු මාස 02 සිට වසර 14දක්වා වූ කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. | ඉදිරියේ දී මෙම නිලධාරීන් බඳවා ගතහොත් මෙම පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කරන බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලග්ගල ගොවිජන සේවා කාරක සභාව මඟින් පිළියෙල කරන ලද අයවැය ඇස්තමේන්තුව වාර්ෂික මූල්‍ය කාර්යසාධනය ප්‍රකාශයේ ආදායම්, වියදම් හා ලාභය සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 80, සියයට 126 හා සියයට 99 ක විචලතාවන් පැවතීමෙන් අයවැය ලේඛනය විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | ඉදිරියේදී හොඳින් අධ්‍යනය කිරීමෙන් අනතුරුව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පිළියෙල කරන බව | නිවැරදි ලෙස අයවැය ඇස්තමේන්තු පිළියෙල කර විධිමත් මූල්‍ය පාලන කාරකයක් ලෙස භාවිතා කළ යුතුය |

**5. ගොවිජන බැංකු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 22කගොවිජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව ගිණුම් වාර්තාව සකස් කර ඇති බව. ඉදිරියේදි වෙනම ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 08ක් මගින් ගොවිජන බැංකු මෘදුකාංගයක් මිලදී ගැනීම සහ එහි සේවා ගාස්තු සඳහා එකතු වටිනාකම රු1,294,800ක් ඉකුත් වර්ෂවලදී වැයකර තිබුණද එම පද්ධති පූර්ණ ලෙසභාවිතා | කඩිනමින් දත්ත ඇතුළත් කර අවසන් කිරීමට කටයුතු කරන බවත් ඉදිරියේදී දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දී ඇති මෘදුකාංගය යොදා ගනිමින් | මෘදුකාංගය අරමුණු ගත කාර්යයන් සඳහා යොදවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොකිරීම, සියලු දත්ත ඇතුළත් කර නොතිබීම හා ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. | ගොවිජන බැංකු කටයුතු කිරීමට පියවර ගන්නා බව. | |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විනිශ්චය සභා සඳහා යොමුකර තිබූ ගොවීන් 54 කට අදාළ රු.2,513,996 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා විනිශ්චය සභා කැඳවීම් කර නොතිබුණි. | විනිශ්චය සභාවට යොමු කරන ලද ණයකරුවන් සඳහා මේ වන විට කැඳවීම් ලැබෙමින් පවතින බව | ණය කඩිනමින් අයකර ගත යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 06 ක පැවති කාන්තා ගොවි සංවිධාන 199 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | ගම්මානයකට එක් සිතමු ගොවි සංවිධාන බැගින් පිහිටුවා ලියාපදිංචි කිරීමට 2019 වර්ෂයේ දී උපදෙස් ලබා දි ඇති නමුත් මේ වන විට ග්‍රාම නිලධාරි වසම් එකකට එක් සමිතියක් බැගින් ඒකාබද්ධ කිරීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මේ වන විට එක් වසමකට එක් කාන්තා ගොවි සංවිධානය බැගින් ඒකාබද්ධ කිරීම සඳහා අනෙකුත් සමිතිවල මහ සභා කැඳවා තීරණ ගෙන අනුමැතිය සඳහා යොමු කර ඇති බව. | කාන්තා ගොවි සංවිධාන සක්‍රීයව පවත්වා ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවීන් 51 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,808,835 ක ව්‍යාපෘති ණය, ගොවිජන සේවා කාරක සභා 02 ක ගොවීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.415,278ක ව්‍යවසායකත්ව ණය හා දේවහුව ගොවිජන බැංකුව මඟින් ලබාදී තිබුණු රු.1,512,073 ක වැසි ආවරණ ණය ශේෂයක්ද වශයෙන් එකතුව රු.3,736,186 ක ණය ශේෂ වර්ෂ 07 සිට 20 දක්වා කාලයක් ගතවී ඇතත් අයකර ගෙන නොතිබුණි. | මේ වන විට එම ණය අයකර ගැනීම සඳහා කටයුතු කරමින් හා විනිශ්චය සභාවට යොමු කරමින් ඇති බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 03ක පැවති ළමා ඉතුරුම් ගිණුම් 512 ක ඉතුරුම් ශේෂය රු.1,000 කට වඩා අඩුවෙන් පැවතුණි. | ලබා දෙන ප්‍රතිලාභ අඩු වීම නිසා වාණිජ බැංකු තුළින් ලබා දෙන තාක්ෂණය හා මුසු වූ පහසුකම් ගොවිජන බැංකු තුළින් ලබා දිය නොහැකි බැවින් ශේෂ අඩුවී ඇති බව හා පෙරමඟ ළමා ඉතුරුම් තැන්පතු සක්‍රිය මට්ටමින් පවත්වා ගැනීම සඳහා පෙර පාසල් වෙත යොමු වි දෙමාපියන් දැනුවත් කර | ඉතුරුම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විවිධ වැටසටහන් සකස් කිරීමට වසම් භාර කෘ.ප.නි. සහකාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දුන් බව. | |
| (ඩ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් ජනතා සමාගමකට 2001 වර්ෂයේ දී රු.1,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණද ණය මුදලින් කිසිදු වාරිකයක් අයකරගෙන නොතිබුණු අතර ණය මුදලට අමතරව සමාලෝචිත වර්ෂය අවසාන දිනට අයකර ගත යුතු පොලී ලෙස රු.1,743,698 ක් ද පැවතුණි. | 2015 වර්ෂයේ විනිශ්වය සභාවට යොමු කර ඇති අතර එම නඩුව මේ වන විට පස් වතාවක් කැඳවා ඇති බව හා පරීක්ෂණ මට්ටමේ පවතින බැවින් තීරණ ලබා දී නොමැති බව. | ණය හා පෙලී මුදල් කඩිනමින් අයකරගත යුතුය. |
| (ඪ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු මඟින් ස්ථාපිත කිරීමට නියමිත නව බැංකු මෘදුකාංගයක් හා ඒ සඳහා වන උපාංග හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මාතලේ දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් මත සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සේවා කාරක සභා 14 ක ගොවිජන බැංකු මඟින් රු.4,028,665 ක් වියදම් දරා ඉන් 3,485,460 ක් සමුච්චිත අරමුදලට කපාහැර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වී මාස 05 ක් ගතවන තුරුත් එකී උපාංග හා උපකරණ ලැබී නොතිබුණු අතර බණ්ඩරපොල ගොවිජනසේවා කාරක සභාව මඟින් භෞතිකව නොමැති රු.543,205 ක් වූ එම වත්කම් වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 ජනවාරි 23 දිනැති 7/12/4 චක්‍රලේඛනයට අනුව මේ වන විට ගොවි බැංකු සමුච්චිත අරමුදලින් අඩු කර ඇති අතර එම වත්කම් ගොවිජන සේවා කාරක සභාවට පවරා ඇති බව හාගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් පරිදි කොමසාරිස් ජනරාල්ගේ නියෝගය අනුව ටෙන්ඩර් කැඳවා ඇති බව. එබැවින් නියමිත ගාස්තු චෙක්පත් මඟින් කොමසාරිස් ජනරාල් නමින් බැර කළ පසු අදාළ උපාංග ලබා දෙන බව දැන්වූයෙන් එම උපදෙස් අනුව කටයුතු කර ඇති බව. | ගිණුම් වාර්තා තුළ අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| (ණ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට දේවහුව ගොවිජන බැංකුවේ රු.894,708 ක් වූ අක්‍රිය ණය ශේෂ 58 ක් පැවති අතර රු.98,016 ක ණය ශේෂ තහවුරු කර ගැනීම සඳහා ණය ලිපිගොනු තොරතුරු නොතිබුණි. | 2024 මැයි 31 දින වනවිට රු.764,248 ක් වූ ණය ශේෂ 47 ක් පවතින අතර, ඉන් රු.124,841 ක් වූ ණය ශේෂ 11 ක් දඹුල්ල උසාවිය වෙත යොමු කර ඇති බව හා ඉතිරි ණය ශේෂ 36 විනිශ්වය සභා වෙත යොමු කර ඇති බව. තොරතුරු නොමැති ණය ශේෂ පිළිබඳව 2024 වර්ෂය තුළ හඳුනාගැනීමට කටයුතු කරන බව. | ණය කඩිනමින් අයකර ගත යුතුය. |